# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.04 පැය 0745 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 917/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීමක් සම්බන්ධ තොරතුරක් ජන මාධ්‍ය වෙත යොමු කිරීම.**

01. **ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

2025.05.03 වන දින දහවල් කාලයේ ත්‍රිකුණාමලය පොලිස් වසමේ සමුදුගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර වියළි ගංජා ග්‍රෑම් 150 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන සුමුදුගම, ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ත්‍රිකුණාමලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

02. **නීති විරෝධි මත්පැන් සහ කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා මූලස්ථාන කඳවුර.**

2025.05.03 වන දින උදෑසන කාලයේ ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා මූලස්ථාන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 45 ක් සහ කේරළ ගංජා ග්‍රෑම් 30 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ජාඇල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 37 ක් වන වීරකැටිය, ඕපනායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

03. **නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාකරේ පොලිස් විශේෂ කාර්‍ය බලකා කඳවුර.**

2025.05.03 වන දින අළුයම් කාලයේ වාකරේ පොලිස් වසමේ කදිරවේලි ප්‍රදේශයේදී වාකරේ පොලිස් විශේෂ කාර්‍ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 20 ක් සහ නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 50 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 49 ක් වන තෝන්පුතුර්, කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාකරේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹුල්ල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

2025.05.03 වන දින දහවල් කාලයේ ගලේවෙල පොලිස් වසමේ සියඹලාගහවෙල ප්‍රදේශයේදී අඹුල්ල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 07 ක් සහ තඹ දහරයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගලේවෙල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 46 ක් වන සියඹලාගහවෙල. වාසල කෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගලේවෙල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අරුගම්බේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

2025.05.03 වන දින රාත්‍රී කාලයේ පොතුවිල් පොලිස් වසමේ සෙංගමුව ප්‍රදේශයේදී අරුගම්බේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ බෝර 12 වගර්යේ පතරොම් 04 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 26 ක් වන සෙංගාමම්, පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**